Sinhalese / සිංහල


Australian Government

චන්දය ප්‍රකාශ කිරීම අනිවාර්යයි

ඔබේ නිල

# ජනමත විචාරණ පොත්පිංච

මේ පොත්පිංචේ පහත දෑ අඩංගුය:




5 පිටුව




23 පිටුව

# මේ පොත්පිංච ගැන

මේ නිල ජනමත විචාරණ පොත්පිංචෙහි වැදගත් ලියවිලි දෙකක් අඩංගු වේ:
ඔබේ නිල Yes/No ජනමත විචාරණ පත්‍රිකාව සහ
2023 ජනමත විචාරණය ඔබේ නිල මග පෙන්වුම




**පිටුව 5** **ඔබේ නිල Yes/No ජනමත විචාරණ පත්‍රිකාව**

**පිටුව 6** **ව්‍යවස්ථාව තුල වෙනස්වනු ඇත්තේ කුමක්ද**

මේ පිටුව ව්‍යවස්ථාවට සිදු කෙරෙනු ඇති යෝජිත සංශෝධන හඳුනා ගනී.

පාර්ලිමේන්තුව තුල ආයතන දෙකෙහිදීම යෝජිත නීතිය සම්මත විය: ව්‍යවස්ථා සංශෝධනය (ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසී ජනතා හඬ) 2023 (Constitution Alteration (Aboriginal and Torres Strait Islander Voice) 2023).

**පිටුව 7** **Yes සහ No කතා**

Yes සඳහා කතාව සහ No සඳහා කතාව එකවර දෙපැත්තෙන් ඉදිරිපත්කර ඇත.

Yes/No කතා ලබාදෙනු ලැබුයේ යෝජිත නීතියට පක්ෂව හෝ විපක්ෂව චන්දය ප්‍රකාශකල සහ එවැනි කතාවක් ජනගතකිරීමට කැමැත්ත පලකල පාර්ලිමේන්තුවේ බහුතරයක් මන්ත්‍රීවරු විසිනි.

**Yes සහ No කතා සංශෝධනය කිරීමට හෝ නිරවද්‍යතාවය පරීක්ෂාකිරීමට AEC හට නීති සම්පාදක අධිකාරයක් නැත.**




**පිටුව 23** **ඔබේ නිල මග පෙන්වුම 2023 ජනමත විචාරණය සඳහා**

චන්දය ප්‍රකාශකිරීම සහ චන්ද මධ්‍යස්ථාන පිළිබඳ වැදගත් තොරතුරු සහ මැතිවරණ කොමසාරිස්තුමා ගෙන් පණිවුඩයක්ද නිල මග පෙන්වුමෙහි ඇතුලත් වේ.

නිල මග පෙන්වුම ඔස්ට්‍රේලියානු මැතිවරණ කොමිසම (AEC) මගින් සකස්කරන ලදි.



# පරිවර්තිත අනුවාද සහ ප්‍රවේශ වියහැකි ආකෘති

**ඔබේ නිල ජනමත විචාරණ පොත්පිංච ඉංග්‍රීසි බසින් සහ අනෙකුත් සංස්කෘතිමය හා භාෂිතයම වශයෙන් විවිධත්වයකින් යුතු භාෂාවලින්ද, First Nations භාෂාවලින්ද, (ශ්‍රව්‍යමය පමණි) දෘශ්‍යාබාධිත සහ මන්ද දෘශ්‍යාබාධිත අය සඳහා ඉංග්‍රීසි භාෂා ආකෘතීන්ගෙන්ද, එමෙන්ම Easy Read මගින්ද (නිල මග පෙන්වුම පමණි) ලබාගත හැක.**

**චන්දය ප්‍රකාශකිරීම සහ ජනමත විචාරණය පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා, ඔබේ බසින් සහය ලබාගැනීමට කරුණාකර 1300 720 153 අමතන්න.**

මේ පිටුව හිස්ව තබා ඇත්තේ සිතාමතාමය



Australian Government

චන්දය ප්‍රකාශ කිරීම අනිවාර්යයි

# ඔබේ නිල

# YES | NO

# ජනමත විචාරණ පත්‍රිකාව

# ව්‍යවස්ථාව තුල සිදුවිය හැකි සංශෝධන

## ව්‍යවස්ථාවට යෝජිත සංශෝධනයන් පිළිබඳ ප්‍රකාශය

ව්‍යවස්ථා සංශෝධනය (ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසී ජනතා හඬ) 2023 (Constitution Alteration (Aboriginal and Torres Strait Islander Voice) 2023) යනුවෙන් යෝජිත නීතිය, VII ඡේදයට පසුව පහත දැක්වෙන වගන්තිය ඇතුලත් කිරීම මගින් ව්‍යවස්ථාව සංශෝධනය කරනු ඇත:

**Chapter IX—Recognition of Aboriginal and Torres Strait Islander Peoples (IX වන ඡේදය — ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසී ජනතාවන් පිළිගැනීම)**

**129 Aboriginal and Torres Strait Islander Voice (ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසී ජනතා හඬ)**

ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසී ජනතාවන් ඔස්ට්‍රේලියාවේ පළමු වාසී ජනතාවන් ලෙස පිළිගැනීම පිණිස:

(i) ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසී ජනතා හඬ ලෙස නම් කල හැකි, ආයතනයක් තිබිය යුතුය;

(ii) ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසී ජනතා හඬ, පාර්ලිමේන්තුවට සහ පොදුරාජ්‍ය මණ්ඩලීය කෘත්‍යාධිකාරී රජයට ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසී ජනතාවගේ කරුණු සම්බන්ධව නියෝජනයන් සලසනු ඇත;

(iii) මෙකී ව්‍යවස්ථාවට යටත්ව ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසී ජනතා හඬ සම්බන්ධව එහි සංයුතිය, ක්‍රියාකාරිත්වය, බලතල හා ක්‍රියාපටිපාටීන් ඇතුළු නීති සම්පාදනයෙහිලා අවශ්‍ය බලය පාර්ලිමේන්තුවට ලැබිය යුතුය.

‘VIII ඡේදය -ව්‍යවස්ථා සශෝධනය’ (Chapter VIII Alteration of the Constitution) පිළිබඳව සඳහන් කිරීමෙන් පසුව පහත වගන්තිය ව්‍යවස්ථාවේ පටුන තුලට ඇතුලත් කිරීම මගින් යෝජිත නීතිය තුලින් ව්‍යවස්ථාවද සංශෝධනය කෙරෙනු ඇත:

| | |
|---|---|
| Chapter IX | Recognition of Aboriginal and Torres Strait Islander Peoples |
| (IX වන ඡේදය | ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසී ජනතාවන් පිළිගැනීම) |



# මීළඟ පිටුවල ඔබට **Yes** සහ **No** කතා හමුවනු ඇත

සියලු මතවාදයන්ට අදාල කතා ලබාදෙනු ලැබුයේ ව්‍යස්ථා සංශෝධනයට යෝජිත නීතියට පක්ෂව හෝ විපක්ෂව චන්දය ප්‍රකාශකල සහ එවැනි මතවාදයක් ජනගතකිරීමට කැමැත්ත පලකල පාර්ලිමේන්තුවේ බහුතරයක් මන්ත්‍රීවරු සහ සෙනෙට් සභිකයන් විසිනි.

යෝජිත නීතියට පක්ෂව චන්දය ප්‍රකාශකල සහ එවැනි මතවාදයක් ජනගතකිරීමට කැමැත්ත පලකල අය විසින් Yes කතාව නිර්මාණය කර ඇති අතර, යෝජිත නීතියට විපක්ෂව චන්දය ප්‍රකාශකල සහ එවැනි මතවාදයක් ජනගතකිරීමට කැමැත්ත පලකල අය විසින් No කතාව නිර්මාණය කර ඇත.

*ජනමත විචාරණ (කාර්ය වින්‍යාස විධිවිධාන) පනත 1984* (පො.රා.ම) 11(1) වගන්තිය අනුව සියලු කතාවක්ම ඉංග්‍රීසි වචන සංඛ්‍යව 2,000කට සීමා විය යුතුය.

# Yes

# වෙනුවන් කතාව

**Yes** ලෙස චන්දය ප්‍රකාශකරන
අය සදහා කතා **10 වෙනි පිටුවෙන්**
ආරම්භකර ඉන්පසුව මාරුවෙන් මාරුවට
ඇති පිටුවල සඳහන් වේ.

**යෝජිත නීතියක්:**

ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසීන් උදෙසා ජනතා හඬ නිර්මාණය කිරීම මගින් ඔස්ට්‍රේලියාවේ පළමුවාසීන් පිළිගැනීමට ලක්කිරීම සඳහා ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට.

**A proposed law:**

To alter the Constitution to recognise the First Peoples of Australia by establishing an Aboriginal and Torres Strait Islander Voice.

**මෙය ලියුවේ කවුරුද?**

(aec.gov.au/referendums/pamphlet.htm වෙතින් බලාගත හැකි) මේ මතවාදයේ අන්තර්ගතය යෝජිත නීතියට පක්ෂව චන්දය ප්‍රකාශකල සහ එවැනි කතාවක් ජනගතකිරීමට කැමැත්ත පලකල පාර්ලිමේන්තුවේ බහුතරයක් මන්ත්‍රීවරු විසින් අනුමැතිය ලබාදී ඇත. මෙහි අන්තර්ගතය මැතිවරණ කොමසාරිස්වරයා විසින් සංශෝධනයකින් තොරව පලකරන ලදි.



# No

# වෙනුවන් කතාව

**No** ලෙස චන්දය ප්‍රකාශකරන
අය සදහා කතා **11 වෙනි පිටුවෙන්**
ආරම්භකර ඉන්පසුව මාරුවෙන් මාරුවට
ඇති පිටුවල සඳහන් වේ.

**යෝජිත නීතියක්:**

ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසීන් උදෙසා ජනතා හඬ නිර්මාණය කිරීම මගින් ඔස්ට්‍රේලියාවේ පළමුවාසීන් පිළිගැනීමට ලක්කිරීම සඳහා ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට.

**A proposed law:**

To alter the Constitution to recognise the First Peoples of Australia by establishing an Aboriginal and Torres Strait Islander Voice.

**මෙය ලියුවේ කවුරුද?**

(aec.gov.au/referendums/pamphlet.htm වෙතින් බලාගත හැකි) මේ මතවාදයේ අන්තර්ගතය යෝජිත නීතියට විපක්ෂව චන්දය ප්‍රකාශකල සහ එවැනි කතාවක් ජනගතකිරීමට කැමැත්ත පලකල පාර්ලිමේන්තුවේ බහුතරයක් මන්ත්‍රීවරු විසින් අනුමැතිය ලබාදී ඇත. මෙහි අන්තර්ගතය මැතිවරණ කොමසාරිස්වරයා විසින් සංශෝධනයකින් තොරව පලකරන ලදි.

# Yes වෙනුවෙන් කතාව

**ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසී ජනතාවට සහ සියලු ඔස්ට්‍රේලියානුවන්හට වඩා හොඳ අනාගතයක් වෙනුවෙන් Yes ලෙස චන්දය ප්‍රකාශ කරමු.**

**එක්සත්බව, බලාපොරොත්තුව සහ සුබවාදී වෙනසක් සඳහා Yes ලෙස චන්දය ප්‍රකාශ කරමු.**

## YES ලෙස චන්දය ප්‍රකාශ කිරීම යනු:

**පිළිගැනීම**

- අපගේ ව්‍යවස්ථාව තුල ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසී ජනතාව **පිළිගැනීම** සහ වසර 65,000 ක සංස්කෘතිය හා සම්ප්‍රදායට ගරුකිරීම.

**සවන්දීම**

- රජයයන්හට වඩා නිවැරදි තීරණයන්ට එළඹීමට හැකිවනු පිණිස ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසී ජනතාව වෙතින් සිය දිවියට අහිතකර ලෙස බලපාන කාරණා සම්බන්ධ උපදෙස්වලට **සවන්දීම.**

**වඩා හොඳ ප්‍රතිපල**

- ජනතාවට වඩා හොඳ දිවියක් ලබාදීම සඳහා ආදිවාසී සෞඛ්‍යය, අධ්‍යාපනය, රැකියා සහ නිවාස වැනි අංශයන්හි **ප්‍රායෝගික ප්‍රගතියක් ඇතිකිරීම.**

## එය ඔබට පමණක් සිදුකල හැකි වෙනසකි

ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසී ජනතාව තුලින්ම එන අදහසක් සඳහා Yes ලෙස චන්දය ප්‍රකාශ කරන්න: **ජනතා හඬ තුලින් කෙරෙන ව්‍යවස්ථාමය පිළිගැනීම (Constitutional Recognition through a Voice).**

### ජනතා හඬ යනු:

ජනතා හඬ (Voice) යනු සිය ප්‍රජාවට අහිතකර ලෙස බලපාන ගැටලු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට හා රජයට උපදෙස් දෙනු ඇති ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසී ජනතාවගෙන් සැදුනු කාරකසභාවකි.

එය සෑම ප්‍රාන්තයකින් හා ටෙරිටරියකින්, ටෝරස් ස්ට්‍රේට් දූපත්වලින් එන ආදිවාසී ඔස්ට්‍රේලියානුවන් සහ පළාත් සහ දුරස්ථ ප්‍රජාවන්හි නියෝජිතයන්ගෙන් සමන්විතවනු ඇත.

ජනතා හඬ සඳහා සාමාජිකයන් සිය ප්‍රාදේශිය කොට්ඨාශයන්හි ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසී ජනතාව අතරින් තොරාගනු ලබන අතර ඔවුන් නිශ්චිත කාලපරිච්ඡේදයන්  සඳහා සේවය කරනු ඇත.

## අපට එය අවශ්‍ය ඇයි:

ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසී ජනතාව මුහුණදෙන සුවිසල් අභියෝග රැසක් ඇත.

- ආදිවාසී නොවන ඔස්ටේලියානුවන්ට වඩා අඩු වසර 8ක් කෙටි ජීවන අපේක්ෂාවක්.
- ලෙඩරෝග සහ ළදරු මරණයන්හි වඩා නරක අනුපාතයන්.
- දෙගුණයක් පමණ ඉහල දිවිනසා ගැනීම් අනුපාතයක්.
- අධ්‍යාපනය හා පුහුණුවීම් සඳහා අඩු අවස්ථා.

පැහැදිලිවම, වර්තමාන ප්‍රවේශය පලරහිතය.

මෙකී හිදැස් පිරවීමට, අනාගතයක් උදෙසා විසඳුම් සහ සැලසුම් සෙවීමට ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසී ජනතාවගේ දිවියට සහ ප්‍රජාවන්ට අහිතකර ලෙස බලපාන ගැටළු පිළිබඳ උපදේශයන්ට අප සවන්දිය යුතුය.

## ජනතා හඬ ක්‍රියාත්මකවන අයුරු:

**ජනතා හඬ උපදෙස් පිළිබඳවයි.**

රජයයන් ජනතාව පෙළන ගැටළු පිළිබඳව සවන්දෙන විට, ඔවුන්:

- වඩා හොඳ තීරණ ගනිති.
- වඩා හොඳ ප්‍රතිපල ලබති.
- මුදලට වැඩි වටිනාකමකි ලබා දෙති.

Yes කතාව තවදුරටත් පි.12

**මෙය ලියුවේ කවුරුද?**

**(aec.gov.au/referendums/pamphlet.htm වෙතින් බලාගත හැකි) මේ මතවාදයේ අන්තර්ගතය යෝජිත නීතියට පක්ෂව චන්දය ප්‍රකාශකල සහ එවැනි කතාවක් ජනගතකිරීමට කැමැත්ත පලකල පාර්ලිමේන්තුවේ බහුතරයක් මන්ත්‍රීවරු විසින් අනුමැතිය ලබාදී ඇත. මෙහි අන්තර්ගතය මැතිවරණ කොමසාරිස්වරයා විසින් සංශෝධනයකින් තොරව පලකරන ලදි.**



# No වෙනුවෙන් කතාව

## NO ලෙස චන්දය ප්‍රකාශ කිරිමට හේතු – සාරාංශයක්

මේ ජනමත විචාරණය හුදු “පිළිගැනීමක්” පමණක් නොවේ. මේ ජනතා හඬ (Voice) යෝජනාව ඊට එහා යන්නකි.

සම්මත වුවහොත් මෙය අප ඉතිහාසයේ ව්‍යවස්ථාවට සිදුවන විශාලතම වෙනස නියෝජනය වන්නකි.

එය නොදන්නා ප්‍රතිවිපාක සහිත, නෛතික වශයෙන් අවදානම් සහිතවූ දෙයකි. එය නිත්‍ය සහ මතභේදන්ට තුඩුදෙන සුළු විය හැකිය.

**ඔබ නොදනී නම් no ලෙස චන්දය ප්‍රකාශ කරන්න.**

### අවදානම් සහිත

වරප්‍රසාද නොලත් ප්‍රජාවන්හි ආදිවාසී ඔස්ට්‍රේලියානුවන් හට උපකාර කිරීමට අප සැමට අවශ්‍යය. කෙසේ නමුදු, මෙකී ජනතා හඬ එයට පිලිතුර නොවන අතර එය අපේ රාජ්‍යපාලන පද්ධතියට සැබෑ අවදානමක් ඇති කරයි.

මේ ජනතා හඬ “කෘත්‍යාධිකාරි රාජ්‍යයක” සියළු වපසරියන් ආවරණය කරයි. මෙයින් අදහස් වනුයේ එයට අත පෙවිය නොහැකි ගැටළුවක් නොමැති බවයි.

රජය නොව, අවසානයේදී මහාධිකරණය එහි බලය තීරණය කරනු ඇත.

එය නෛයිතික අභියෝගයන්, ප්‍රමාදයන් සහ අකර්මණ්‍ය රාජ්‍යය වැනි අවදානම් ඇති කරයි.

### නොදන්නා දේ

ජනතා හඬ සඳහා සාමාජිකයන් තෝරාගන්නා අයුරු පිළිබඳ තොරතුරු කිසිවක් ඉදිරිපත් කොට නොමැත. මෙකී තොරතුරු තෝරා බේරා ගැනීමට පෙර ඔස්ට්‍රේලියානුවන්ට චන්දය ප්‍රකාශ කිරීමට සිදුකර ඇත.

**ඔස්ට්‍රේලියානුවන්ට චන්දයට පසුව නොව ඊට පෙර තොරතුරු ලැබිය යුතුය.**

එය ක්‍රියාකරන අයුරු අප නොදනිමු, කවුරුන් එහි සිටීද යන්න නොදනිමු, එනමුදු එය ඔස්ට්‍රේලියානුවන් වශයෙන් අප ස්ථිරවම බෙදීමට ලක්කරනු ඇති බව අපි දනිමු.

සමහරක් ජනතා හඬ ආධාරකරුවන් පවසන්නේ මෙය වන්දි සහ හානිපූරණය සහ අනෙකුත් අන්තගාමී වෙනස්කම් උදෙසා පළමු පියවරක් පමණක් වනු ඇති බවයි. එසේනම්, ඉන්පසුව සිදුවන්නේ කුමක්ද?

### මතභේදයන්ට තුඩුදෙන

ඔස්ට්‍රේලියාවේ එක් පිරිසක් පමණක් ව්‍යවස්ථාව තුල නියෝජනය වීම යනු අපේ රට නිත්‍යවශයෙන් බෙදීමකි.

එය ව්‍යවස්තාවේ පූර්ණ බලාත්මක සහය සහිත නොදන්නා අධිකාරියක් හරහා විවිධ වූ පුරවැසි පන්ති භේදයන් ඇති කරයි. බොහෝ ඔස්ට්‍රේලියානු ආදිවාසීන් මෙයට සහය පලනොකරති.

### නිත්‍ය

ව්‍යවස්ථාව තුල ජනතා හඬක් ඇතුලත් කිරීම යනු නිත්‍ය දෙයකි. අප ඍණාත්මක ප්‍රතිවිපාක තුල සිරවනු ඇත.

## NO ලෙස චන්දය ප්‍රකාශ කිරීමට හේතු දහයක්

### 1. මෙකී ජනතා හඬ නෛතිකව අවදානම් සහගතය

ඔස්ට්‍රේලියානු ව්‍යවස්ථාව යනු අපගේ වඩාත්ම වැදගත් නෛයිතික ලියවිල්ල වේ. සෑම වචනයක්ම අර්ථ දැක්වීමට විවෘතය.

1977 සිට ඔස්ට්‍රේලියානු ව්‍යවස්ථාව සංශෝධනය කර නොමැත. **මෙය ඔස්ට්‍රේලියානු ඉතිහාසයේ ප්‍රජාතාන්ත්‍රවාදයේ විශාලතම වෙනස විය හැකිය.**

එය නොදන්නා දෙයකට පැනීමකි. මෙකී ජනතා හඬ පරීක්ෂා කර බලා නැත. මෙවැන්නක් හා සංසන්දනය කල හැකි ව්‍යවස්ථාමය අධිකාරයක් ලොව කොතැනකවත් නැත.

ව්‍යවස්ථාව තුල ජනතා හඬක් නිරූපනය කිරීම යන්නෙන් අදහස් කරනුයේ එය මහාධිකරණය මගින් නෛයිතික අභියෝගයන්ට හා අර්ථ දැක්වීම් වලට විවෘත බවයි.

මෙවැනි ව්‍යවස්ථාමය සංශෝධනයක් මහාධිකරණය කෙසේ අර්ථ දක්වයිද යන්න පිළිබදව නීති විශාරදයන් එකඟ නොවෙනු ඇති අතර එය කෙසේ සිදුවේද යන්න දැනගත නොහැක.

No කතාව තවදුරටත් පි.13

**මෙය ලියුවේ කවුරුද?**

**(aec.gov.au/referendums/pamphlet.htm වෙතින් බලාගත හැකි) මේ මතවාදයේ අන්තර්ගතය යෝජිත නීතියට විපක්ෂව චන්දය ප්‍රකාශකල සහ එවැනි කතාවක් ජනගතකිරීමට කැමැත්ත පලකල පාර්ලිමේන්තුවේ බහුතරයක් මන්ත්‍රීවරු විසින් අනුමැතිය ලබාදී ඇත. මෙහි අන්තර්ගතය මැතිවරණ කොමසාරිස්වරයා විසින් සංශෝධනයකින් තොරව පලකරන ලදි.**

වඩා හොඳ ළදරු සෞඛ්‍ය තත්වයන්ගේ සිට දුරස්ථ පළාත්වල සේවා දියුණුකිරීම දක්වා ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසී ජනතාව මුහුණදෙන ප්‍රධාන ගැටළුවලට ජනතා හඬ උපදෙස් දෙනු ඇත.

එහෙත් සියලු නීති, වැඩසටහන් හා අරමුදල් සැපයීම පිළිබඳව පාර්ලිමේන්තුව සහ රජය තවදුරටත් වගකිව යුතුය.

**Western Australia සඳහා සෙනෙට්වරයකු වන, Patrick Dodson, Yawuru වැඩිහිටි:**
*"බිම් මට්ටමේ ජනතාවට සවන්දුන් විට හා ඔවුන් සහභාගි කරගත් විට, වඩා යහපත් නීති සහ ප්‍රතිපත්ති නිර්මාණය වේ. ජනතා හඬ වෙතින් ලැබෙන උපදෙස් අපගේ තීරණ හා දිශානතියන් වඩා දැනුම්වත් සහ වඩා සාර්ථක වනු ඇත. ව්‍යවස්ථාව තුල පිළිගැනීමට ලක්වීම අප ජාතිය සුවපත් වීමට හේතු වේ."*

## ජනතා හඬ: ප්‍රධාන කරුණු

- ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසී ජනතාව තුළින් එන අදහසෙකි.
- ව්‍යවස්ථාව තුල පළමු වාසීන් (First Peoples) පිළිගැනීමට ලක් වේ.
- ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසී ජනතාවගෙන් සැදුම්ලත් කාරක සභාවකි.
- තමුන් පෙළන ගැටළු පිළිබඳව සිය මතය පලකිරීමට ජනතාවට අවස්තාවක් ලැබේ.
- සවන්දීම යනු වඩා ප්‍රතිඵලදායී බවකි – එමෙන්ම වටිනාකමින්ද වඩා ඉහල අගයක් ගනී.
- සියලු ප්‍රාන්ත සහ ටෙරිටරිවලින්, ටෝරස් ස්ට්‍රෙට් දූපත් සහ දුරස්ථ ප්‍රජාවන්හි නියෝජිතයන්.
- තරුණ පරපුරක් සහ ඒ තුල ස්ත්‍රී පුරුෂ සමතුලිතභාවයක්ද ඇතුලත්වනු ඇත.
- පාර්ලිමේන්තුව සහ රජය තවදුරටත් නීති, වැඩසටහන් සහ අරමුදල් සැපයීම පිළිබඳව වගකිව යුතුය.

**YES යනුවෙන් චන්දය ප්‍රකාශකිරීමට තවත් හේතු 8ක් දක්වා කියවන්න.**

## 1. මෙකී අදහස පැමිණියේ ඉඳුරාම ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසී ජනතාව තුලිනි.

Yes යනුවෙන් චන්දය ප්‍රකාශකිරීම යනු:

- දශක ගණනාවකට පෙර සිටම ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසී ජනතාව විසින් පලකරන ලද අභිලාෂයන්ට සහය පලකිරීම.
- 80% කට වඩා ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසී ජනතාවක් විසින් සහය පළකල යෝජනාවක් පිළිගැනීම.

**ජනතා හඬ උදෙසා අවශ්‍යතාවය දේශපාලකයින් තුලින් ආවක් නොවේ.**

2017දී රටපුරා සිදුවූ කාර්යයන් සහ නොගිණිය හැකි තරම් කෙරුණු සාකච්ඡාවලින් පසුව 250 ක් පමණ වූ ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසීන් *හදවතින් කල උලුරු ප්‍රකාශය (Uluru Statement from the Heart)* අනුමත කළහ.

ජනතා හඬ මගින් ව්‍යවස්ථාව තුල පිළිගැනීමක් ඉල්ලා සිටීම.

සිය දිවියෙහි ප්‍රායෝගික වෙනසක් ඇතිකරගැනීමට සහ සිය දරුවන් සඳහා යහපත් අවස්ථා ඇතිකිරීමට අපෙන් සහය ඉල්ලා සිටීම.

| |
|---|
| සියලු ජීවන රටාවන්හි, සියලු ඇදහීම් සහ සංස්කෘතීන්හි සහ සියලු දේශපාලන පාර්ශවයන්හි ඔස්ට්‍රේලියානුවන් මෙකී යෝජනාවලියට සහය පලකර ඇත. |

දැන් අපට මෙය යථාර්ථයක් බවට පත්කල හැකිය.

Yes යනුවෙන් චන්දය ප්‍රකාශකිරීම යනු සියලු ඔස්ට්‍රේලියානුවන් එකමුතුකරන සමගියේ ක්‍රියාවකි.

## 2. ස්ථිරසාර ප්‍රථිපල සඳහා ව්‍යවස්ථාමය පිළිගැනීමක්.

ව්‍යවස්ථාමය පිළිගැනීමක් යනු ප්‍රායෝගික වෙනසක් උදාකරන ප්‍රබල ප්‍රකාශයකි.

**Yes යනුවෙන් චන්දය ප්‍රකාශකිරීම යනු:**

- ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසී ජනතාව ඔස්ට්‍රේලියාවේ පළමු වාසීන් ලෙස පිළීගැනීමයි.
- වසර 65,000ක ඉතිහාසය සැමරීම සහ බෙදාගැනීම.
- ඔස්ට්‍රේලියාවේ සමගිය පිළිබඳ බලගතු පණිවුඩය ලෝකය වෙත යැවීම.

Yes කතාව තවදුරටත් පි.14

**මෙය ලියුවේ කවුරුද?** **(aec.gov.au/referendums/pamphlet.htm වෙතින් බලාගත හැකි) මේ මතවාදයේ අන්තර්ගතය යෝජිත නීතියට පක්ෂව චන්දය ප්‍රකාශකල සහ එවැනි කතාවක් ජනගතකිරීමට කැමැත්ත පලකල පාර්ලිමේන්තුවේ බහුතරයක් මන්ත්‍රීවරු විසින් අනුමැතිය ලබාදී ඇත. මෙහි අන්තර්ගතය මැතිවරණ කොමසාරිස්වරයා විසින් සංශෝධනයකින් තොරව පලකරන ලදි.**





**"දශකයක් හෝ ඊට වැඩි කාලයක ජනතා හඬ තුලින් නැගෙන ව්‍යවස්ථාමය සහ පරිපාලනමය නඩු කටයුතු මාහට කල් තියා පෙනෙනවා..."**
*(Ian Callinan AC KC, හිටපු මහධිකරණ විනිසුරු)*[1]

මෙය අප්‍රසන්න නෛතික ව්‍යකුලතාවයන් ඇති කරයි.

## 2. එහි තොරතුරු නැත

මෙය විශාල තීන්දුවකි. කෙසේ නමුත්, **චන්දයට පෙර රජය ප්‍රධාන තොරතුරු අනාවරණය නොකරනු ඇත**.

එය අඩු වරප්‍රසාද සහිත ප්‍රජාවන්ට උපකාර කරන අයුරු හෝ පරතරය අවම කරන්නේ කෙසේද යන්න අප නොදනිමු.

ජනතා හඬ තුල සමාජිකයින් කීදෙනෙකු සිටිනු ඇත්ද යන්න අප නොදනිමු.

ඔවුන් පත්කරනු හෝ තෝරා පත්කරනු ඇති දැයි හෝ එය සිදුවන්නේ කෙසේද යන්න අප නොදනිමු.

එය නියෝජනය කරන අයුරු හෝ වගකියනු ඇති අයුරු අප නොදනිමු.

| |
|---|
| මේ තොරතුරු දැනගත හැකි වන්නේ චන්දය ප්‍රකාශ කලාට පසුවය. |

Yes ප්‍රචාරණ ව්‍යාපාරයට අනුව චන්දයට පෙර තොරතුරු ලැබීම "*තේරුමක් ගෙන නොදෙන්නකි*".

"ව්‍යවස්ථා සංශෝධනයකට ඔස්ට්‍රේලියානු ජනතාවගේ සහය අපට ලැබෙන තුරු එකී සවිස්තරාත්මක උපදේශණය සිදුකිරීම තේරුමක් නැති ක්‍රියාවකි."
*(Yes23 පොත් පිංච)*

මෙය වැරදි මාර්ගයකි.

ඔබ පරික්ෂා නොකර නිවසක් මිලදී නොගන්නා සේම පදවා නොබලා වාහනයක්ද නොගන්නවා ඇත.

එසේ වෙතත් මෙය තොරතුරු ලබා නොදී ව්‍යවස්ථා සංශෝධනයකට චන්දය ප්‍රකාශ කරන ලෙස ඔබෙන් ඉල්ලා සිටීමකි.

හිස් චෙක්පතක් අත්සන් කිරීමට ඔස්ට්‍රේලියානුවන්හට බලකල නොයුතුය.

"තොරතුරු නොදන්නා දෙයකට ඔස්ට්‍රේලියානුවන් යම් අයුරකින් එකඟ වනුයේ කෙසේද?"
*(Kerrynne Liddle සෙනෙට්වරිය, ළමා ආරක්ෂණ සහ පවුල් හිංසන වළක්වන ඡායා අමාත්‍ය සහ Arrernte කාන්තාව)*

## 3. එය අප බෙදනු ඇත

| |
|---|
| එක් කණ්ඩායමක ඔස්ට්‍රේලියානුවන් පමණක් ව්‍යවස්ථාව තුල නිරූපණය කිරීම යනු ඔස්ට්‍රේලියානුවන් ස්ථිරවම බෙදාවෙන් කිරීමකි. බොහෝ අදිවාසී ඔස්ට්‍රේලියානුවන් එකඟ නොවෙති. |

**"මෙකී ජනතා හඬ අප එක්සත් කරනු වෙනුවට ජාතියක් වශයෙන් බෙදා වෙන්කරනු ඇත."**
*(Jacinta Nampijinpa Price සෙනෙට්වරිය, ආදිවාසී ඔස්ට්‍රේලියානුවන් සදහා ඡායා අමාත්‍ය සහ Warlpiri කාන්තාව)*

මෙය අපගේ ප්‍රජාතන්ත්‍රවාදී හර පද්ධතියේ ප්‍රධාන මූලධර්මයක් වන නීතිය ඉදිරියේ සියලු ඔස්ට්‍රේලියානුවන් සාමානය යන්නට එරෙහිව යයි.

"යෝජිත s 129 ඇතුලත් කිරීමේ තේරුම වන්නේ අප ජාතියක් බවට පත්වන්නේ අපේ මුතුන්මිත්තන් මුලින්ම මෙරටට ආ දිනයෙන් මිස අප සියල්ල සමානයන් වීමෙන් නොවේ."
*(David Jackson AM KC, හිටපු Federal Court විනිසුරු)*[2]

අපේ ව්‍යවස්ථාව සියළු ඔස්ට්‍රේලියානුවන්ට අයිතිය. අපේ පාර්ලිමේන්තුව සියළු ඔස්ට්‍රේලියානුවන් නියෝජනය කරයි. එහි දැනට අදිවාසී මන්ත්‍රීවරු 11ක් සිටිති.

අප "එකකු සහ නිදහස්" බව පෙන් වීමට අපගේ ජාතික ගීය මෑතකදී වෙනස් කරනු ලැබීය.

**අනෙක් අතට, නීතියෙන් සහ අධ්‍යාත්මයෙන් මෙකී ජනතා හඬ ස්ථිරවම ඔස්ට්‍රේලියානුවන්, බෙදා වෙන්කරනු අත.**

1 The Australian, 17/12/2022
2 පාර්ලිමෙන්තු විමර්ශණ වාර්තාව, 11/04/2023

X

No කතාව තවදුරටත් පි.15

**මෙය ලියුවේ කවුරුද?** **(aec.gov.au/referendums/pamphlet.htm වෙතින් බලාගත හැකි) මේ මතවාදයේ අන්තර්ගතය යෝජිත නීතියට විපක්ෂව චන්දය ප්‍රකාශකල සහ එවැනි කතාවක් ජනගතකිරීමට කැමැත්ත පලකල පාර්ලිමේන්තුවේ බහුතරයක් මන්ත්‍රීවරු විසින් අනුමැතිය ලබාදී ඇත. මෙහි අන්තර්ගතය මැතිවරණ කොමසාරිස්වරයා විසින් සංශෝධනයකින් තොරව පලකරන ලදි.**

- අනාගතය වෙනුවෙන් ප්‍රායෝගික වෙනසක් ඇති කිරීම.

සිය සංස්කෘතිය සහ නිර්මාණශීලිත්වය, භූමිය සහ ජලය පිළිබඳ දැනුම, සහ ඔස්ට්‍රේලියානු ජනජීවිතයට සිය දායකත්වය යනාදිය මගින් ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසී ජනතාව පරපුරු ගණනාවක් අප ජාතිය පෝෂණය කර ඇත.

අපේ පුරාණ මහද්වීපය ජීවමාන පැරණිතම සංස්කෘතීන්ට නිවහනකි. ව්‍යවස්ථාව තුළින් පිළිගැනීම මගින් අපගේ බෙදාහදා ගත් ඉතිහාසය සැමරීම සිත් තුළට කාවද්දන මාර්ගයකි.

Yes යනුවෙන් චන්දය ප්‍රකාශ කිරීම යනු නියමාකාර ප්‍රථිඵල ලබාදෙන සමගිසම්පන්න ක්‍රියාවකි.

> ආදිවාසී ඔස්ට්‍රේලියානුවන් පිළිගැනීමේ ආකාරයක් ලෙස අපගෙන් ඉල්ලා සිටින්නේ ජනතා හඬ කරෙහි සහය දැක්වීමයි. එය ප්‍රායෝගික වෙනසක් උදෙසා වාහකයක්.

**Johnathan Thurston, NRL ශූර සහ පුහුණුකරු, Gunggari මිනිසා:**
*"අපේ තරුණ ජනතාව තම උපරිමය සඳහා උරුමකම් කියති. මා ක්වීන්ස්ලන්තයේ Yarrabah ප්‍රජාවේ පාසල් දරුවන් හා සමීපව කටයුතු කරමි. ඔවුන් මුහුණපාන බාධකයන් මා දැක ඇත්තෙමි. ඔවුන්ගේ ගම්බද ප්‍රජාව තරම් වෙන කිසිවකු ඒවා වටහා නොගනිති. ඔවුනට සිය ශක්තීන් කරා ළඟාවීමට අවශ්‍ය පිළිගැනීමක් ලබා දීම විශාල දෙයක්. ජනතා හඬ යනු එයයි."*

## 3. ජනතාවට වඩා යහපත් දිවියක් සහතික කිරීම

ජනතා හඬ යනු ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසී ජනතාවගේ පහත දේ සඳහා නියමාකාර අභිවෘද්ධීන් ළඟාකරවීමට සමත් උපාය වාහකයකි:

- ජීවන අපේක්ෂාව.
- ළදරු මරණ සහ සෞඛ්‍යය.
- අධ්‍යාපනය සහ රැකීරක්ෂා.

බොහෝ කාලයක සිට සද්භාවයකින් යුතු රජයයන් මෙකී ගැටළු විසඳීමට බිළියන ගණනක් වැයකොට ඇත.

ඔවුන් බිම්මට්ටමේ ජනතාවට සවන් නොදීම හේතුවෙන් කල්පවත්නා අභිවෘද්ධීන් ළඟා කරගෙන නොමැත.

වර්තමාන ප්‍රවේශයන් අසාර්ථක වී ඇති හෙයින් ඒවා පිළිසකර කිරීමට හොඳම අවස්ථාව මෙකී ජනතා හඬය.

ජනතා හඬ සියල්ල ක්ෂණයකින් විසඳනු ඇතයි කිසිවකු නොසිතති – එනමුදු අවසානයේදී යථා ප්‍රවේශයක් අප අත්කර ගනු ඇත.

**මෙහි දැක්වෙනුයේ ආදිවාසීන්හට සවන්දීම තුලින් වඩා යහපත් ප්‍රතිඵල ලබාදීම සම්බන්ධ උදාහරණ තුනකි:**

**ජනතා හඬ තුලින් ඔස්ට්‍රේලියාව ලබාගන්නා දියුණුව සිතෙහි මවාගන්න.**

### සවන්දීමේ කාර්යයන්: වඩා හොඳ සෞඛ්‍ය සේවාවන්

ප්‍රජාව මගින් පාලනයවන ආදිවාසී සෞඛ්‍ය සේවා ගම්වාසී ආදිවාසීන් රැකියාවන්හි යොදවති.

ඔවුන් වෛද්‍ය සායන පවත්වාගෙන යන අතර ළමා ප්‍රතිශක්තිකරණය වැනි අත්‍යවශ්‍ය සේවා සළසමින් දුරස්ථ ප්‍රදේශයන්හි සංචාරය කරති.

ගිණිකොණදිග ක්වීන්ස්ලන්තයේ, ප්‍රාදේශීය ආදිවාසී වෛද්‍ය සේවා සහ ප්‍රජාව එක්ව ක්‍රියාකරමින් වාර්ෂික සෞඛ්‍ය පරීක්ෂාවන් වසර 10ක් තුල 550 සිට 20,000කටත් වඩා සංඛ්‍යාවක් දක්වා විශාල වශයෙන් ඉහල දැමීමට කටයුතු කළහ.

### සවන්දීමේ කාර්යයන්: අධ්‍යාපනයෙහි වඩා හොඳ ප්‍රතිඵල

Arnhem Land හි නව Dhupuma Barker පාසලෙහි පාඩම් සැලසුම්වල සිට නිල ඇඳුම් හා දිවා ආහාරයන් සැපයීම දක්වා සියලු පියවර පවුල්වල සහ ප්‍රජා මූලිකයන්ගේ සහභාගිත්වයෙන් සිදු වේ.

හෘදයංගම හවුල්කාරිත්වය තුලින් ඉතා හොඳ **පාසල් පැමිණීමේ අනුපාතයන් හා වඩා හොඳ ප්‍රථිපල අත්කර ගැනීම් සිදුවේ**. 'Dhupuma Firebirds' යන Robotics කණ්ඩායම Texasහි ජාත්‍යන්තර VEX ශූරතාවය සඳහා තරඟ වැදුනු අතර එය සුදුසුකම් ලත් උතුරු ටෙරිටරියේ පළමු කණ්ඩායම බවටද පත්විය.

විදුහල්පති Phillip Heath මෙසේ පවසයි:
*"පළාත් සහ දුර බැහැර අධ්‍යාපනයේදී ප්‍රජාවට සවන් දීම යනු ප්‍රධාන පෙරළිකාර සාධකයක්."*

Yes කතාව තවදුරටත් පි.16

**මෙය ලියුවේ කවුරුද?** **(aec.gov.au/referendums/pamphlet.htm වෙතින් බලාගත හැකි) මේ මතවාදයේ අන්තර්ගතය යෝජිත නීතියට පක්ෂව චන්දය ප්‍රකාශකල සහ එවැනි කතාවක් ජනගතකිරීමට කැමැත්ත පලකල පාර්ලිමේන්තුවේ බහුතරයක් මන්ත්‍රීවරු විසින් අනුමැතිය ලබාදී ඇත. මෙහි අන්තර්ගතය මැතිවරණ කොමසාරිස්වරයා විසින් සංශෝධනයකින් තොරව පලකරන ලදි.**





"අප සියල්ලන් ඔස්ට්‍රේලියානුවන්ය. එය අවසන් විය යුත්තේද එලෙසමය. ඊනියා ජනතා හඬ මගින් මේ රට කේන්ද්‍රයේ සිටම බෙදී වෙන්වන්නට යාමට ඉඩ නොදිය යුතුය."
(*Ian Conway, Central Arrernte ජ්‍යෙෂ්ඨ භාරකාර*)

## 4. එය ආදිවාසී ඔස්ට්‍රේලියානුවන්ට උපකාරී නොවෙනු ඇත.

අප සියළු දෙනාටම අඩු වරප්‍රසාද ලත් ප්‍රජාවන් හී ආදිවාසී ඔස්ට්‍රේලියානුවන්ට පරතරය පියවීමට සහ සමගිසම්පන්න වීමට උපකාර කිරීමට අවශ්‍යය.

**කෙසේ වෙතත් තවතවත් නිලධාරීවාදය පිළිතුර නොවේ.**

දැනට ආදිවාසීන් සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසීන් නියෝජනය කරන විවිධ මට්ටමේ රජයේ ආයතන සිය ගණනක් ඇති අතර කාර්ය මණ්ඩලය 1,400ක් සිටින National Indigenous Australians Agency ද ඒ අතර ඇත.

මධ්‍යගත ජනතා හඬ ග්‍රාමීය සහ දුරස්ථ ප්‍රජාවන්හි අවශ්‍යතා සැලකිල්ලට නොගැනීමේ අවදානමක් ඇති කරයි.

"ජාතික ජනතා හඬකට රට වෙනුවෙන් කථා කල නොහැක."
(*Nyunggai Warren Mundine AO, Australians for Unity මණ්ඩල සභික සහ Bundjalung මිනිසා*)

මේ අවස්ථාවේදී, බොහෝ ඉල්ලීම් කෙරෙනුයේ දුරස්ථ ප්‍රජාවන්හි පවතින ඉතා කණගාටුදායක සමාජ ගැටළුවලට පිළියම් ලෙසය.

අවශ්‍යව ඇත්තේ ක්‍රියාත්මක වීමය.

**"කැන්බරා වලින් අපට අවශ්‍ය සවන්දීමක් මිස ජනතා හඬක් නොවේ."**
(*Jacinta Nampijinpa Price සෙනෙට්වරිය, ආදිවාසී ඔස්ට්‍රේලියානුවන් සඳහා ඡායා අමාත්‍ය සහ Warlpiri කාන්තාව*)

## 5. කිසිම ගැටළුවක් එහි විෂයපථයෙන් ඔබ්බට ගොස් නැත.

මේ ජනතා හඬ මොඩලය පාර්ලිමේන්තුවට පමණක් නොවේ, එය බොහෝ ඈතට දිවෙන්නක් – "කෘත්‍යාධිකාරී රජයේ" සියළු අංශයන් වෙත. **මෙයට සියළු රජයේ දෙපාර්තමේන්තු, ආයතන සහ අනෙකුත් අධිකාරීන් (Reserve Bank වැනි).**

ආරථිකය සම්බන්ධ තීන්දු, ජාතික ආරක්ෂාව යටිතල පහසුකම්, සෞඛ්‍ය අධ්‍යාපනය සහ අනෙකුත් දේ යන සියල්ල විෂය පථය තුල තිබිය යුතුය.

රජයේ ජනමත විචාරණ කාර්යසාධන කණ්ඩායමේ සාමාජිකයකුගේ වචනවලින්:

"ජනතා හඬට කැබිනට් මණ්ඩලය, ඇමතිවරු, රජයේ සේවකයන්, සහ ස්වාධීන ව්‍යවස්ථාපිත කාර්යාල සහ ආයතන වැනි රජයේ සියලු අංශයන්ට කතා කල හැකිවනු ඇත - Reserve Bank වැනි....එයට ජනතා හඬ නිහඬ කල නොහැක."
(*මහාචාර්යවරුන් වන Megan Davis සහ Gabrielle Appleby*)[3]

ජනතා හඬට සහය දෙන ව්‍යවස්ථා නීති මහාචාර්යවරයකුගේ වචනවලින්:

"මා සිතන්නේ එය දරුණුලෙස සාවද්‍යයි, මක්නිසාද යත් එය කරනුයේ විධායකයේ ක්‍රියාවන්හි පූර්ණ පරාස විමර්ශණ බලය තමන් වෙත තබාගැනීමයි. මෙයින් අදහස් වනුයේ ජනතා හඬට සබ්මැරීනයන්ගේ සිට රථගාල් අවසරපත් දක්වා සියල්ල ගැන කතා කිරීමට හැකි වීමයි.... නිතිපතා අධිකරණමය මැදිහත් වීම් අපට තියේවි."
(*මහාචාර්ය Greg Craven AO*)[4]

බොහෝ නීති විශාරදයින් එහි විෂයපථය සම්බන්ධව තම මතය ප්‍රකාශ කර ඇති නමුදු ඔවුනගේ සැකයන් සරලවම බැහැරකොට ඇත.

## 6. එහි ප්‍රමාදයන් සහ අකර්මණ්‍යතා අවදානමක් ඇත

ඔස්ට්‍රේලියානු පාර්ලිමේන්තුව වසරකට නීති සම්පාදන කොටස් සිය ගණනක් සම්බන්දයෙන් කටයුතු කරයි.

දෙපාර්තමේන්තු, ආයතන, සහ "කෘත්‍යාධිකාරී රජයක" සියලු පරාසයන් ආවරණය කරමින් ජනතා හඬ විෂයපථය පාර්ලිමෙන්තුවෙන් ඔබ්බට ගමන් කරයි.

ජනතා හඬ මෙය කෙසේ හසුරවයිද?

**උපදේශණයක් සම්බන්ධව ජනතා හඬ සෑහීමකට පත් නොවේ නම්, හෝ එළඹනු තීරණයක් සම්බන්ධව සෑහීමට පත් නොවේ නම්, එයට අධිකරණය වෙත යා හැක. මේ සම්බන්ධව කෙතරම් කාලයක් ගත වේද?**

---

3 The Australian, 1/4/2023
4 Daily Mail, 24/3/2023

No කතාව තවදුරටත් පි.17

**මෙය ලියුවේ කවුරුද?** **(aec.gov.au/referendums/pamphlet.htm වෙතින් බලාගත හැකි) මේ මතවාදයේ අන්තර්ගතය යෝජිත නීතියට විපක්ෂව චන්දය ප්‍රකාශකල සහ එවැනි කතාවක් ජනගතකිරීමට කැමැත්ත පලකල පාර්ලිමේන්තුවේ බහුතරයක් මන්ත්‍රීවරු විසින් අනුමැතිය ලබාදී ඇත. මෙහි අන්තර්ගතය මැතිවරණ කොමසාරිස්වරයා විසින් සංශෝධනයකින් තොරව පලකරන ලදි.**

### සවන්දීමේ කාර්යයන්: ආදිවාසී උයන්පාලකයන්

ප්‍රාදේශීයව සේවා නියුක්ත ආදිවාසී  උයන්පාලකයන් ආසන්න වශයෙන් 2,000ක් පමණ සිටිති.

උයන්පාලකයන් **ලැව්ගිනි වැළැක්වීමට කටයුතු කිරීම, වල් සතුන් පාලනයකිරීම සහ ගංගාවල තත්ව පාලනය මගින්** අපේ පරිසරය ආරක්ෂාකිරීමට කටයුතු කරති.

ආදිවාසී උයන්පාලකයන්ට සවන්දීම යනු අපේ ඉඩම් සහ ජලාශ පිළිබඳ අවුරුදු 65,000ක දැනුම සහ සම්බන්ධය බෙදාහදා ගැනීමයි.

**Yes යනුවෙන් චන්දය ප්‍රකාශකිරීම යනු ඔස්ට්‍රේලියාව පුරා යහපත් ප්‍රතිපල ලබා ගැනීමයි.**

**පරතරය අවම කිරීමට Yes යනුවෙන් චන්දය ප්‍රකාශ කරන්න.**

## 4. අපගේ දේශයේ එක්සත් කරන්නට.

Yes යනුවෙන් චන්දය ප්‍රකාශ කිරීම යනු:

- අතීතය පිළිබඳ අමිහිරි මතකයන් පසෙකලා වඩා හොඳ අනාගතයක් කරා යාම.
- ඔබට පමණක් සිදුකල හැකි වෙනසක්.

1901දී අපගේ ව්‍යවස්ථාව බලාත්මක වීමෙන් පසුව ඔස්ට්‍රේලියාව මෙතෙක් දිගු ගමණක් පැමිණ ඇත.

අප දැන් ආදිවාසී ඔස්ටේලියානුවන් සහ රට වෙනුවෙන් ඔවුන්ගේ දායකත්වය නියමාකාරයෙන් සමරන්නෙමු.

ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසී ජනතාවද අන් සියල්ලන් මෙන්ම ජනගහණය තුළ පිළිගැනීමට ලක්වනු පිණිස 1967 ජනමත විචාරණයේදී ඔස්ට්‍රේලියානුවන්ගෙන් 90% ක් ව්‍යවස්ථා සංශෝධනයට Yes යනුවෙන් චන්දය ප්‍රකාශ කළහ.

එය එක්සත් කරණු පිණිස ඉදිරියට තැබූ පියවරකි.

ජනතා හඬ තුළින් ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසී ජනතාව පිළිගැනීමට - මීළඟ පියවර එකට තබන්නට අපට අවස්ථාවක් ලැබී ඇත.

සමාන ඉතිහාසයක් ඇති කැනඩාව, නව සීලන්තය නිල වශයෙන් සිය පළමු වාසීන් පිළිගත්තේ දශක ගණනාවකට පෙරය.

**ප්‍රත්‍යක්ෂයෙන් පෙනීයන්නේ බියවීමට හේතුවක් නැති බවත් - ලඟාකරගැනීමට බොහෝ දෑ ඇති බවත්ය.**

**Rachel Perkins, Alice Springs වලින් පැවත එන සිනමාවේදිනියක වන, Arrernte/Kalkadoon කාන්තාව:**

*"වඩා හොඳ දිවියක් උදෙසා අවස්ථාව ලැබෙන තුරු අපේ ජනතාව දශක ගණනාවක් කාළය ගත කළා. මෙතරම් කිසිදාක අප අධිෂ්ඨානපූර්වක හෝ සාමූහික වී නැහැ. ජනතා හඬ අපේ හොඳම උත්සාහයයි, අප එය භාරගනිමු."*

## 5. මුදල් ඉතුරුකිරීම

රජයන් ජනතාවට සවන්දෙන විට, වඩා යහපත් ප්‍රතිපල ලැබෙන අතර, අරමුදල් වඩා ඵලදායීව භාවිතාකල හැක.

**Aunty Pat Anderson AO, Uluru Dialogues සම සභාපති, Alyawarre කාන්තාව**:

*"ජනතාව සහභාගී කරගන්නා විට, ඔබ වඩා යහපත් තීරණ ගන්නා අතර වැයකරන මුදල් අත්‍යවශ්‍ය දේ වෙනුවෙන් වැයවනු ඇත: බිම්මට්ටමේ මිනිසුන් මත."*

දෙපාර්ශවයේම රජයන් බිලියන ගණනක් වැඩසටහන් උදෙසා ආයෝජනය කර ඇති නමුදු ඒවා ගැටළු විසඳා නැති අතර, ප්‍රජාවන් වෙත ලැබී නැත.

ජනතා හඬ අපට ගම්වැසියන්ට සවන්දීමට සහ මුදල් ඉතිරිකිරීමට සහය වේ.

ඵල රහිත දෑ වෙනුවෙන් බදු ගෙවන්නන්ගේ  මුදල් නොගෙවන විට අප සියළුදෙනා ඉන් ප්‍රතිලාභ ලබනු ඇත.

## 6. මේ නියම වේලාවයි

ජනතා හඬ සම්බන්ධ අදහස දශක ගණනාවක් තිස්සේ මෝදුවෙමින් පවතී. ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසී බොහෝදෙනෙකු මේ වෙනුවෙන් ශ්‍රමය සහ සද්භාවයන් යොදා ඇත.

No යනුවෙන් චන්දය ප්‍රකාශකිරීම මගින් අදහස් වන්නේ කිසිවක් වෙනස් නොවීමයි. එහි තේරුම අපට කිසිවක් කල නොහැකි බව පිළිගැනීමයි.

**එකම දෙය පිළිබඳව වැඩි අවදානමක් නොගන්න:**

- පහළම ජීවන අපේක්ෂාව.

Yes කතාව තවදුරටත් පි.18

**මෙය ලියුවේ කවුරුද?**

**(aec.gov.au/referendums/pamphlet.htm වෙතින් බලාගත හැකි) මේ මතවාදයේ අන්තර්ගතය යෝජිත නීතියට පක්ෂව චන්දය ප්‍රකාශකල සහ එවැනි කතාවක් ජනගතකිරීමට කැමැත්ත පලකල පාර්ලිමේන්තුවේ බහුතරයක් මන්ත්‍රීවරු විසින් අනුමැතිය ලබාදී ඇත. මෙහි අන්තර්ගතය මැතිවරණ කොමසාරිස්වරයා විසින් සංශෝධනයකින් තොරව පලකරන ලදි.**





බොහෝ නීති විශාරදයන් මෙය තීන්දු ගැනීමේ සැලකිය යුතු ප්‍රමාදයන් ඇති වන බවට අනතුරු අගවා ඇත.

"වෙහෙසකර පුළුල් පරාසයක පවතින ජාතික මට්ටමේ ගැටළු වලට ජනතා හඬ සත්‍යවශයෙන්ම අකුණු සන්නායකයක් බවට පත්ව ඇත. වර්තමානයේ ගැඹුරු අවධානය යොමුවූ ගැටළු සියල්ලටම පාහේ යම් ආකාරයක ආදිවාසී සංඝටකයක් පෙනෙන්නට ඇත."
(*Nicholas Hasluck AM KC, හිටපු WA ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු*)[5]

නෛතික අභියාචනවල අවදානම සහ ප්‍රමාදයන් යනු අකර්මණ්‍ය රජයක අවදානමකි.

එය ඔස්ට්‍රේලියාවට යහපත් නොවේ.

## 7. එය ක්‍රියාකාරීන් හට දොරටු විවෘත කරනු ඇත

නෛතික අස්ථාවරබව සහ තොරතුරු නොමැති බව නගන්නාවූ පැනය නම්: ඉන්පසුව සිදුවන්නේ කුමක්ද?

> සමහරක් ජනතා හඬ ආධාරකරුවන් කෙලින්ම පවසන්නේ මෙය වන්දි සහ හානිපූරණය සහ අනෙකුත් අන්තගාමී වෙනස්කම් උදෙසා පළමු පියවරක් වනු ඇති බවයි.

"මෙය පළමු පියවරයි, එය වැදගත් පියවරක් මෙන්ම සියළු පැහැදිලිකිරීම් පසෙකලා කලයුතුය. උදාහරණයක් ලෙස 'Pay the Rent', එය ආදිවාසීන් සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසීන්හට විනිවිදභාවයෙන් යුතුව කරන්නේ කෙසේද සහ ඔවුනට සත්‍යවශයෙන් වන්දි සහ හානිපූරණය ඉටු කරන්නේ කෙලෙසකද...?"
(*Thomas Mayo, ජනමත විචාරණ ක්‍රියාකාරී කණ්ඩායම*)[6]

සත්‍යය පැවසීමට සහ සන්ධානයකට පෙර ජනතා හඬ පළමු පියවර බව හදවතින් කල උලුරු ප්‍රකාශය (Uluru Statement from the Heart) කියා සිටී.

අර්ථනිරූපනයට අනුව සන්ධානයක් යනු රජයන් අතර ගිවිසුමක් මිස, එක් පුරවැසි කණ්ඩායමක් සහ එහි රජය අතර ඇතිවන්නක් නොවේ.

රජයේ ජනමත විචාරණ කාර්යසාධන කණ්ඩායමේ සාමාජිකයකු "සත්‍යය" යන්න පැරණි යටත් විජිත ආයතනයන්හි අහෝසිය පිණිස යන ගමනේ යොදාගන්නා "ලීවරණයක්" ලෙස විස්තර කර ඇත.

"එය අපේ ජනතාවට අවශ්‍ය දේ ලබාගැනීමට අවශ්‍ය සන්ධානයන් බිහිකිරීම උදෙසා සහ අනෙකුත් නීති සම්පාදනය, ප්‍රතිසංස්කරණය සහ අපට උවදුරු කරන්නාවූ පැරණි යටත්විජිත ආයතනයන්හි අහෝසිය සම්බන්ධයෙන් වන කතිකාවන් ඇති කරගන්නා මාර්ගයකි"
(*Thomas Mayo, ජනමත විචාරණ ක්‍රියාකාරී කණ්ඩායම*)[7]

දැනටමත් බොහෝ ක්‍රියාකාරීහු Australia Day **අවලංගු කිරීමට, ජාතික කොඩිය සහ අනෙකුත් ආයතන සහ ඔස්ට්‍රේලියානුවන්ට වැදගත් සංකේත වෙනස්කිරීමට ප්‍රචාරණ කටයුතු ගෙනයති.**

"සැමවිටම එය #abolishAustraliaDay (#ඔස්ට්‍රේලියාදිනයඅහෝසිකරනු) යන්නයි. එය වෙනස් කිරීම පසුබෑමකි."
(*Teela Reid, ජනමත විචාරණ නියුක්ති කණ්ඩායම*)[8]

ව්‍යවස්ථාමය පිළිගැනීමක් ඇති ජනතා හඬක් ඇත්නම්, මෙකී ඉල්ලීම්වල ඝෝෂාව තවත් වැඩිවනු ඇත.

"ඔස්ට්‍රේලියානු ඉතිහාසය නැවත ලියවීම උදෙසා, ගිවිසුමක් සහ මූල්‍යමය වන්දියක් ඉල්ලාසිටීමට සැලසුම්කරන Makarrata කොමිසම මගින් ස්වෛරීභාවයේ සහ සහජීවනයේ ඉල්ලීම් දිනාගැනීම සහ පිළිගැනීමක් ඇතිකර ගැනීම උදෙසා ජනතා හඬ භාවිතාවනු ඇති බව ඔස්ට්‍රේලියානුවන් තේරුම්ගත යුතුය…
ඔස්ට්‍රේලියානු ජන සමාජයට පිරිමැසිය නොහැකි හානියක් සිදුකල හැකිය යන්නෙන් අදහස්වනුයේ ජනතා හඬ කිසිසේත් ඔස්ට්‍රේලියානු ව්‍යවස්ථාවට අන්තර්ගත නොකල යුතු බවයි..."
(*Terence Cole AO RFD KC, හිටපු NSW ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු*)[9]

## 8. එය මිල අධික සහ නිලධාරිවාදයට යටත් වනු ඇත

මේ ජනතා හඬට තවත් අතිරේක මුදල් වෙන්කරනු ඇතැයිද යන්න අප නොදනිමු.

එයද ජනමත විචාරණයෙන් පසුව පමණක් තීරණය කරනු ලබන තවත් එක් තොරතුරකි.

5 පාර්ලිමේන්තු විමර්ශණ වාර්තාව, 16/4/2023
6 SEARCH මූලාරම්භ කථාව, 12/2/2020
7 SEARCH මූලාරම්භ කථාව, 12/2/2020
8 Twitter, 24/1/2023
9 Spectator Australia, 6/4/2023; පාර්ලිමේන්තු විමර්ශණ වාර්තාව, 19/4/2023

No කතාව තවදුරටත් පි.19

**මෙය ලියුවේ කවුරුද?**

**(aec.gov.au/referendums/pamphlet.htm වෙතින් බලාගත හැකි) මේ මතවාදයේ අන්තර්ගතය යෝජිත නීතියට විපක්ෂව චන්දය ප්‍රකාශකල සහ එවැනි කතාවක් ජනගතකිරීමට කැමැත්ත පලකල පාර්ලිමේන්තුවේ බහුතරයක් මන්ත්‍රීවරු විසින් අනුමැතිය ලබාදී ඇත. මෙහි අන්තර්ගතය මැතිවරණ කොමසාරිස්වරයා විසින් සංශෝධනයකින් තොරව පලකරන ලදි.**

- අධ්‍යාපනයේ සහ රැකීරක්ෂාවල පහළම ප්‍රතිඵල.
- සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වඩා නරක ප්‍රතිඵල.

Yes යනුවෙන් චන්දය ප්‍රකාශකිරීමෙන් මෙකී චක්‍රය බිඳහෙලා ජාතිය එක්සත් කරමු.

**Eddie Betts, Adelaide සහ Carlton AFL ශූර, Gubrun, Wirangu/Kokatha මිනිසා:**
*"එක රැයකින් සියලු දේ සඳහා ජනතා හඬ තුලින් විසඳුම් නොලැබෙන බව මා දන්නාමුත්, අපට බලපාන ගැටළු සඳහා තීන්දු ගැනීමේදී අප එයට ඇතුලත්වනු හා සැලකීමට ලක්වන මාර්ගයක් විවෘතවන බව මා දනිමි."*

## 7. ප්‍රතිඵලදායක ප්‍රායෝගික උපදෙස්.

ජනතා හඬ ආදිවාසී සෞඛ්‍යය, අධ්‍යාපනය, රැකීරක්ෂා සහ නිවාස පිළිබඳ ප්‍රතිඵලදායී ප්‍රායෝගික පියවර උදෙසා උපදෙස් දෙනු ඇත.

ජනතා හඬ ව්‍යවස්ථාවට ඇතුලත්කිරීම මගින් එයට වර්තමාන සහ අනාගත ස්ථාවරත්වයට හා ස්වාධීනත්වයට ඉඩ ලබාදේ.

මින් අදහස්වනුයේ කෙටිකාලීන දේශපාලනයේ සිර නොවී කෙලින් උපදෙස් දීමට ජනතා හඬට හැකියාවක් ඇති බවය.

**ආදිවාසී ඔස්ට්‍රේලියානුවන් මුහුණදෙන සියලු අභියෝගයන්ට එක් රැයින් විසඳීමට අපට හැකියාවක් නැත. දිගුකාලීන සැලසුම් මෙන්ම වහා ක්‍රියාත්මක වීමක්ද අපට අවශ්‍යය.**

එක පෑන් පහරකින් අවලංගු කල නොහැකි ජනතා හඬක් අපට අවශ්‍යවන්නේ එබැවිනි.

නීති හෝ තීන්දු වැළැක්වීමට, පමාකිරීමට හෝ නිෂේධනය කිරීමට ජනතා හඬට හැකියාවක් නොමැති බව නීති විශාරදයින් පැහැදිලිකොට පෙන්වාදී ඇත. **ජනතා හඬ යනු උපදෙස්ය**.

## 8. රජය වඩා කාර්යක්ෂම කරවීම

Yes යනුවෙන් චන්දය ප්‍රකාශකිරීම යනු:

- රජයට වඩා හොඳ උපදෙස් ලැබීම සහ වඩා යහපත් ප්‍රතිඵල ලබාදීම.
- ව්‍යවස්ථාවට අමතරව ප්‍රවීණයන් විසින් සහය ලබාදීම.

ජ්‍යෙෂ්ඨ නීතිඥයින් හා හිටපු මහාධිකරණ විනිසුරන් මෙකී ක්‍රියාවලියේ කොටස්කරුවන් වෙති.

### නීති විශාරදයන් මේ පිළිබඳව පවසන්නේ:

- ව්‍යවස්ථානුකූලව සහ නෛතිකව සවිමත්.
- අපගේ රාජ්‍ය යාන්ත්‍රණ පද්ධතිය **උසස් කෙරෙනු** ඇත.
- නිෂේධ බලයක් නොමැත – අවසන් අනුමැතිය සතුවන්නේ රජයට සහ පාර්ලිමේන්තුවටය.

**Robert French AC, ඔස්ට්‍රේලියානු මහධිකරණ අග විනිසුරු 2008-2017 සහ**
**Geoffrey Lindell, ගෞරව සහිතව විශ්‍රාමලත් නීති මහාචාර්ය, Adelaide විශ්ව විද්‍යාලයය:**
*"ජනතා හඬ යනු සුවිසල් අදහසක් වන නමුදු සංකීර්ණ නොවන්නකි. ඉහල ප්‍රතිඵලයක් උදෙසා අවම අවදානමකි...*
*පාර්ලිමේන්තුවට සහ රජයට දැනැගත් සහ ගැලපෙන සහ විශ්වාසවන්ත උපදෙස් ලබාදීමට ප්‍රායෝගික අවස්ථාවක් ජනතා හඬ පළමු වාසීන්හට ලබාදෙනු ඇත."*
- ඒකාබද්ධ මතය තීරුව, Australian Financial Review, 4/2/2023.

## දැන් එය අපට අයත් කාර්යභාරයකි.

**Evonne Goolagong Cawley AC MBE, හිටපු ලොව අංක එක ටෙනිස් ක්‍රීඩිකා, Wiradjuri කාන්තාව:**
*"Yes යනුවෙන් චන්දය ප්‍රකාශකිරීම යනු ආදිවාසීන් සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසී ජනතාවන් විසින් අප රට වෙත සැපයූ දායකත්වයට සහ ඉදිරි පරපුරට සිය සිහින හඹායාමට ලබාදුන් සහය සැමරීමට සියළු ඔස්ට්‍රේලියානුවන්හට අවස්ථාවකි. මෙකී අවස්ථාව අප දෝතින් වැළඳ ගනිමු."*

ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසී ජනතාව අපට පරපුරකට එකවරක් පමණක් ලැබෙන අවස්ථාවක් ලබාදී ඇත.

**වඩා යහපත් අනාගතයක් උදාකරන සමගි සම්පන්න ශ්‍රේෂ්ඨ මොහොතක කොටස්කරුවන් වන්නට Yes යනුවෙන් චන්දය ප්‍රකාශකිරීම මගින් අපට හැකිය.**

අපට පහත දේ උදෙසා Yes යනුවෙන් චන්දය ප්‍රකාශකල හැක:

**Yes කතාව තවදුරටත්** පි.20

**මෙය ලියුවේ කවුරුද?** **(aec.gov.au/referendums/pamphlet.htm වෙතින් බලාගත හැකි) මේ මතවාදයේ අන්තර්ගතය යෝජිත නීතියට පක්ෂව චන්දය ප්‍රකාශකල සහ එවැනි කතාවක් ජනගතකිරීමට කැමැත්ත පලකල පාර්ලිමේන්තුවේ බහුතරයක් මන්ත්‍රීවරු විසින් අනුමැතිය ලබාදී ඇත. මෙහි අන්තර්ගතය මැතිවරණ කොමසාරිස්වරයා විසින් සංශෝධනයකින් තොරව පලකරන ලදි.**





**දැනට ආදිවාසීන් සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසීන් නියෝජනය කරන** විවිධ මට්ටමේ රජයේ ආයතන **සිය ගණනක් ඇත.**

> මේ වසරේදී, රජය $ බිලියන 4.3ක් කාර්ය මණ්ඩලය 1,400ක් සිටින National Indigenous Australians Agency වෙනුවෙන් වෙන්කොට ඇත.

මෙකී ආයතනයේ වෙබ් අඩවිය සහ ව්‍යාපාර සැලැස්මේ: "අප.... ආදිවාසීන් සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසීන්හට බලපාන තීරණවලදී ඔවුනගේ නියෝජනය සහතික කරමු" යැයි සඳහන් වේ.

ජනතා හඬ මේ කිසිවක් ආදේශ කරන බවට කිසිදු ඉඟියක් දී නොමැත.එය තවත් එක නිලතන්ත්‍රයක් වනු ඇත.

### 9. මේ ජනතා හඬ නිත්‍යවනු ඇත

මේ ජනතා හඬ අත්හදා බැලීමක් හෝ නියමු වැඩසටහනක් නොවනු ඇත. එය නැවත වෙනස්කල හැකි නීති සම්පාදනය තුලද නොසිටනු ඇත.

එය ව්‍යවස්ථාවට ඇතුල් වූ පසු එය වෙනස්කල නොහැක.

මහාධිකරණය අර්ථකථනයක් කල පසු, පාර්ලිමේන්තුවට එය නිෂ්ප්‍රභා කල නොහැක.

එහි සෘණාත්මක ප්‍රතිඵලයන් සමග අප සැමදා කොටුවනු ඇත.

### 10. ඉදිරියට යා හැකි වඩා යහපත් මාර්ගයන් ඇත

මේ ජනමත විචාරණය සරලව ආදිවාසී ඔස්ට්‍රේලියානුවන් ව්‍යවස්ථාව තුල පිළිගැනීමම නොවේ.

**මෙය අවදානම් සහිත, නොදන්නා සහ නිත්‍ය ජනතා හඬක් උදෙසා වෑයම් නොකර ලබාගත හැකිය.**

පිළිගැනීම සම්බන්ධයෙන් ඔස්ට්‍රේලියානුවන් තුල පුළුල්ව පැතිරුණු සහයයක් ඇත. එනමුදු මෙකී ජනතා හඬ යෝජනාව ගැටළුවකි.

ප්‍රතිපත්තියක් වශයෙන් ජනතා හඬකට විරුද්ධ බොහෝ ඔස්ට්‍රේලියානුවන් ඇත.

තවත් සමහරෙක් අඩු අවදානමක් සහිත ජනතා හඬකට කැමති වනු ඇති අතර, ඒ සම්බන්ධව විකල්පයක් රජය ඔබට දී නැත.

මීට පෙර ව්‍යවස්ථාවට සංශෝධන යෝජනා වූ අවස්ථාවලදී විකල්ප සහ තොරතුරු නියමාකාරයෙන් සළකා බැලීමට Constitutional Convention තිබුනි.

එවැනි කිසිදු ක්‍රියාවලියක් මෙහි සිදු නොවින. මේ ක්‍රියාවලිය හදිසි සහ බලහත්කාරී ලෙස සිදු විය.

මේ ප්‍රවේශය එක්සත් නොකරයි, ප්‍රතිපලදායී නැත. එය බෙදනසුළුය.

## තීන්දුව ඔබේය

මෙය ඉතා වැදගත් තීන්දුවකි. අවාසනාවකට, ඔස්ට්‍රේලියානුවන්ගේ සාධාරණ ගැටලු සහ ඕනෑකම් ප්‍රතික්ෂේප කර ඇත.

වාසනාවකට, මේ ජනමත විචාරණය දේශපාලකයින්, සංස්ථා හෝ ජනප්‍රිය පුද්ගලයින් විසින් තීරණය නොකරනු ඇත.

සියලු ඔස්ට්‍රේලියානුවන් විසින් එය තීරණය වනු ඇත. එය සියලු ඔස්ට්‍රේලියානුවන් හට බලපානු ඇත.

**ඔබ නොදනී නම්, no ලෙස චන්දය ප්‍රකාශ කරන්න.**

## වැඩිදුර තොරතුරු

යාවත්කාලීන තොරතුරු සඳහා පිවිසෙන්න:

- www.riskyvoice.com
- www.oneandfree.au
- www.australiansforunity.com.au

**NO** කතාවේ අවසානය.

**No කතාව තවදුරටත්** පි.21

**මෙය ලියුවේ කවුරුද?** **(aec.gov.au/referendums/pamphlet.htm වෙතින් බලාගත හැකි) මේ මතවාදයේ අන්තර්ගතය යෝජිත නීතියට විපක්ෂව චන්දය ප්‍රකාශකල සහ එවැනි කතාවක් ජනගතකිරීමට කැමැත්ත පලකල පාර්ලිමේන්තුවේ බහුතරයක් මන්ත්‍රීවරු විසින් අනුමැතිය ලබාදී ඇත. මෙහි අන්තර්ගතය මැතිවරණ කොමසාරිස්වරයා විසින් සංශෝධනයකින් තොරව පලකරන ලදි.**

## **Yes** වෙනුවෙන් කතාව

- ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසී ජනතාව වෙනුවෙන් නිවැරදි දේ ඉටුකිරීම.
- ජනතාවට තමන්ට අහිතකරව බලපාන ගැටළු වලට අයිතියක් ලබාදීම.
- ජීවිත නංවාලන ප්‍රායෝගික වෙනසක් ඇති කිරීම.

**පිළිගැනීමට, සවන්දීමට** සහ **වඩා යහපත් ප්‍රතිඵල උදෙසා** Yes යනුවෙන් චන්දය ප්‍රකාශ කරමු.

ඔවුන්ගේ දරුවන්ට වැඩි අවස්ථා සමගින් ආදිවාසී සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසී ජනතාවට වඩා යහපත් ජීවන තත්වයන් සඳහා Yes යනුවෙන් චන්දය ප්‍රකාශ කරමු.

සමගියේ ජීවගුණයෙන්, අපි Yes යනුවෙන් චන්දය ප්‍රකාශ කරමු.

**YES කතාවේ අවසානය.**



**මෙය ලියුවේ කවුරුද?**

**(aec.gov.au/referendums/pamphlet.htm වෙතින් බලාගත හැකි) මේ මතවාදයේ අන්තර්ගතය යෝජිත නීතියට පක්ෂව චන්දය ප්‍රකාශකල සහ එවැනි කතාවක් ජනගතකිරීමට කැමැත්ත පලකල පාර්ලිමේන්තුවේ බහුතරයක් මන්ත්‍රීවරු විසින් අනුමැතිය ලබාදී ඇත. මෙහි අන්තර්ගතය මැතිවරණ කොමසාරිස්වරයා විසින් සංශෝධනයකින් තොරව පලකරන ලදි.**

## **No** වෙනුවෙන් කතාව

No සඳහා කතාව 19 පිටුවෙන් නිම විය



**මෙය ලියුවේ කවුරුද?**

**(aec.gov.au/referendums/pamphlet.htm වෙතින් බලාගත හැකි) මේ මතවාදයේ අන්තර්ගතය යෝජිත නීතියට විපක්ෂව චන්දය ප්‍රකාශකල සහ එවැනි කතාවක් ජනගතකිරීමට කැමැත්ත පලකල පාර්ලිමේන්තුවේ බහුතරයක් මන්ත්‍රීවරු විසින් අනුමැතිය ලබාදී ඇත. මෙහි අන්තර්ගතය මැතිවරණ කොමසාරිස්වරයා විසින් සංශෝධනයකින් තොරව පලකරන ලදි.**

මේ පිටුව හිස්ව තබා ඇත්තේ සිතාමතාමය



AEC
Australian Electoral Commission

# ඔබේ නිල මග පෙන්වුම

## 2023 ජනමත විචාරණය සඳහා

**මැතිවරණ දිනය කවදාද?**

QR කේතය ස්කෑන්කර හෝ aec.gov.au/referendums වෙත පිවිස වැඩි විස්තර දැනගත හැක

**aec.gov.au**
13 23 26

10 Mort Street, Canberra හි මැතිවරණ කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලදි
Authorised by the Electoral Commissioner, 10 Mort Street, Canberra

# මැතිවරණ කොමසාරිස්වරයාගේ **පණිවුඩය**

ජනමත විචාරණයක් පවත්වා සෑහෙන කළක් ගතවී ඇත. එවැන්නක් අවසන්වරට පැවැත් වූයේ 1999 දී බැවින් මෙය කියවන බොහෝදෙනා ජනමත විචාරණයක චන්දය ප්‍රකාශකරන පළමු අවස්තාව මෙය විය හැකිය.

ජනමත විචාරණයක් යනු යෝජිත ව්‍යවස්ථා සංශෝධනයක විසඳිය යුතු කරුණ පිළිබඳව ජාතික චන්දයක්ය – මෙහිදී, ඔස්ට්‍රේලියාවේ පළමු වාසීන් ලෙස ආදිවාසීන් සහ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසීන් ගේ ජනතා හඩ පිහිටුවා එය පිළිගැනීමට ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතුද යන්නයි.

ජනමත විචාරණයක චන්දය ප්‍රකාශකිරීම මැතිවරණයකින් වෙනස්වන අතර, 'ද්විගුණ බහුතරයක්' චන්දය ප්‍රකාශකරන ආකාරය මත මෙහි ප්‍රතිඵලය පාදක වේ – එනම්:

- සියලුම ප්‍රාන්ත සහ ටෙරිටරිවලින් (50%කට වඩා) ජාතික බහුතරයක්, සහ
- බහුතරයක් ප්‍රාන්තයන්ගෙන් (50%කට වඩා) බහුතරයක් (අවම වශයෙන් ප්‍රාන්ත හයෙන් හතරක්)

නිවැරදිව චන්දය පාවිච්චි කරන අයුරු, චන්ද මධ්‍යස්ථානයකදී සිදුවන දේ සහ තොරතුරු මූලාශ්‍ර පිරික්සීමට උපදෙස් ඇතුළුව ජනමත විචාරණයකදී ඔබේ චන්දය ප්‍රකාශකරන අයුරු සැලසුම්කිරීම දැක්වෙන මේ මගපෙන්වුම AEC මගින් නිර්මාණය කර ඇත.

7,000කට වඩා චන්ද මධ්‍යස්ථාන මැතිවරණ දිනයේදී රටපුරා විවෘතව තැබෙනු ඇති අතර, වේලාසනින් චන්දය ප්‍රකාශකරන විකල්පයන් සහ තවත් කිසිදු කලෙක නොවූ තරම් Remote Voter Services කණ්ඩායම් දුරස්ථ ස්ථානයන් වෙත පිවිසෙනු ඇත.

අපක්ශපාතී වීම සහ ස්වාධීන වීම Australian Electoral Commission හි පදනමයි.අප විසින් හසුරුවනු ලබන ක්‍රියාවලියන්හි විනිවිදභාවය, සුරක්ෂිතභාවය සහ වගකියයුතු බව ඉතා වැදගත් වන අතර එය සැමදෙනා හටම දැකගත හැකි විය යුතුය.

ජනමත විචාරණය පැවැත්වීමේ ක්‍රියාවලියේ සෑම පියවරකම අප ඉටුකරන අවංක කාර්යභාරය පිළිබඳව මා අභිමානයෙන් යුතු වෙමි.

වැඩිදුර තොරතුරු සඳහා **aec.gov.au/referendums** වෙත පිවිසෙන්න.

**Tom Rogers**
මැතිවරණ කොමසාරිස්වරයා

මැතිවරණ නාම ලේඛණයේ සුදුසුකම් ලබන චන්ද දායකයින් **97%** වඩා

**7,000+** චන්ද මධ්‍යස්ථාන

වේලාසන චන්දය ප්‍රකාශකරන මධ්‍යස්ථාන **500+**

**100,000** දක්වා තාවකාලික ජනමත විචාරණ සේවකයින්

# **නැවතී සලකා බලන්න**
## මෙවර ජනමත විචාරණයෙහි මූලාශ්‍ර පිරික්සන්න

ජනමත විචාරණ සමයේදී චන්දය ප්‍රකාශකිරීමේ ක්‍රියාවලිය පිළිබඳ සාක්ෂි මගින් තහවුරු නොවන, අන්තර්ගතය අසම්පූර්ණ හෝ නොමග යවනසුලු තොරතුරු ඔබට ලැබෙනු ඇත.

AEC යනු ජනමත විචාරණය පැවැත්වීම සඳහා අධිකාරය ලැබූ ස්වාධීන ආයතනයයි. සහභාගීවීමට අවශ්‍ය සුදුසුකම්, ජනමත විචාරණයන්හි අරමුණු, චන්ද ප්‍රකාශකිරීමේ විකල්ප පිළිබඳව චන්දදායකයන් හා අප සන්නිවේදනය කරන්නෙමු.

ජනමත විචාරණ ක්‍රියාවලිය පිළිබඳ ඔබ දකින, අසන, සහ කියවන දෑ පිළිබඳව ප්‍රවේශමින් සලකා බැලීම වැදගත් වේ.

තොරතුරු පහත අයුරුදැයි සළකා බැලීමට කාලය වැයකරන්න:

- විශ්වාසදායක හෝ හඳුනාගත හැකි මූලාශ්‍රයක්
- වර්තමානයට තවමත් අදාල
- සුරක්ෂිත (වංචනික නොවන)

සමාජ මාධ්‍ය සහ මාර්ගගතවන විට මෙය විශේෂයෙන් වැදගත්ය.

වැඩිදුර තොරතුරු සහ ප්‍රයෝචනවත් උපදෙස් සඳහා **aec.gov.au/stopandconsider** වෙත පිවිසෙන්න.






# **ජනමත විචාරණයේදී චන්දය ප්‍රකාශකිරීමට සැලසුම් කරන්න**
## චන්ද මධ්‍යස්ථාන පෙව 8 ට විවෘතවන අතර හරියටම පව 6 ට වසනු ලැබේ

### චන්දය දිය යුත්තේ කවුරුද?

මේ ජනමත විචාරණයේදී අවුරුදු 18 හෝ ඊට වැඩි සියලුම ඔස්ට්‍රේලියානු පුරවැසියන් ලියාපදිංචි වීමටත් චන්දය ප්‍රකාශකිරීමටත් අවශ්‍යය.

### මා හට චන්දය ප්‍රකාශකල හැක්කේ කොතැනද?

මැතිවරණ දිනයේ ඔබේ ප්‍රාන්තය හෝ ටෙරිටරියේ ඕනෑම චන්ද මධ්‍යස්ථානයදී ඔබට චන්දය ප්‍රකාශ කල හැකිය. චන්ද මධ්‍යස්ථාන පෙව 8 සිට පව 6 දක්වා විවෘතව තබනු ලැබේ.

චන්ද මධ්‍යස්ථාන සාමාන්‍යයෙන් ප්‍රාදේශීයව පිහිටි පාසල්, පල්ලි, ප්‍රජා ශාලා සහ පොදු ගොඩනැගිලිවල පිහිටුවා ඇත. ආසන්නම චන්ද මධ්‍යස්ථානය සොයාගැනීමට **aec.gov.au/where** වෙත පිවිසෙන්න

ඔබට ඇවිදීමේ යම් අපහසුතාවයක් හෝ යම් දුබලතාවයක් ඇත්නම් හෝ එවැනි යමෙකුට සත්කාර කරන්නේ නම් චන්ද මධ්‍යස්ථානයන්හි ප්‍රවේශ තොරතුරු සඳහා **aec.gov.au/where** වෙත පිවිසෙන්න

දෘශ්‍යාබාධිත සහ සඳහා මන්ද දෘශ්‍යාබාධිත චන්ද ප්‍රකාශකිරීමේ විකල්ප සඳහා **aec.gov.au/assistance** වෙත පිවිසෙන්න නැතිනම් **13 23 26** අමතන්න.

### මා වෙනත් ප්‍රාන්තයක හෝ ටෙරිටරියක සිටීනම්?

මැතිවරණ දිනයේ ඔබ අන්තර්ප්‍රාන්ත ගතව සිටීවි නම්, ඔබට නම්කල අන්තර්ප්‍රාන්ත චන්ද මධ්‍යස්ථානයක චන්දය ප්‍රකාශකිරීමට හෝ වේලාසනින් චන්දය ප්‍රකාශකිරීමේ විකල්පයන් ඇත.

### මැතිවරණ දිනයේදී මා හට එය කල නොහැකි නම්?

මැතිවරණ දිනයේදී ප්‍රාන්තයේ හෝ ටෙරිටරියේ චන්ද මධ්‍යස්ථානයකට ඔබට යා නොහැකි නම්, තැපැල් මගින් හෝ වේලාසනින් පුද්ගලිකව චන්දය ප්‍රකාශකිරීමට සුදුසුකම් ලබනු ඇත.

### වේලාසනින් පුද්ගලිකව චන්දය ප්‍රකාශ කලහැකි අයුරු

ඔබ සුදුසුකම් ලබන්නේ නම්, ඔබට මැතිවරණ දිනයට හෝ ඊට පෙර චන්දය ප්‍රකාශ කලහැක.වේලාසනින් චන්දය ප්‍රකාශකරන චන්ද මධ්‍යස්ථාන මැතිවරණ දිනයට සති දෙකකට පෙර සඳුදා දිනයේ සිට විවෘතව තබනු ඇත. විවෘතව තබන වේලාවන් වෙනස්වන නිසා **aec.gov.au/where** වෙත පිවිස සෑම මධ්‍යස්ථානයකම තොරතුරු විමසා බලන්න.

ඔබ සුදුසුකම් ලබන්නේද යන්න සහ වේලාසනින් චන්දය ප්‍රකාශකිරීම පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා **aec.gov.au/early** වෙත පිවිසෙන්න, නැතහොත් **13 23 26** අමතන්න.

### තැපැල් මගින් වේලාසනින් චන්දය ප්‍රකාශකරන අයුරු

සුදුසුකම් සපුරන චන්දදායකයන් හට තැපැල් චන්දය ලබාගත හැක.ඔබේ සුදුසුකම් පිරික්සා, QR කේතය ස්කෑන්කර හෝ මාර්ගගතව **aec.gov.au/pva** වෙතින් අයැදුම්කරන්න.

ඔබට මාර්ගගත ප්‍රවේශයක් නොමැති නම් හා තැපැල් චන්දයක් අයැදුම්කිරීමට අවශ්‍ය නම් කරුණාකර **13 23 26** අමතන්න.

**මැතිවරණ දිනට පෙර බදාදා දින පව 6 ට පෙර** AEC වෙත ලැබෙනු පිණිස ඔබේ තැපැල් චන්දය සඳහා අයැදුම් පත කල් ඇතුව සම්පූර්ණ කරන්න.

# **චන්ද මධ්‍යස්ථානයේ සිදුවන දේ**

1. චන්ද පත්‍රිකා නිකුත්කරන තැනට ඔබ ළඟා වෙනවිට, මැතිවරණ නිලධරයකු ඔබේ සම්පූර්ණ නම සහ ලිපිනය, 2023 ජනමත විචාරණයේ ඔබ දැනටමත් චන්දය ප්‍රකාශකර ඇත්දැයි අසනු ඇත.ඔබේ නම මැතිවරණ නාමලේඛණයෙන් කපා දමනු ලැබේ.
2. චන්ද පත්‍රිකාව ඔබ වෙත ලබාදෙනු ඇත.
3. චන්ද පත්‍රිකාවේ සඳහන් උපදෙස් ප්‍රවේශමින් කියවන්න.
4. චන්ද පත්‍රිකාව සම්පූර්ණ කරන්න.
5. ඔබේ චන්ද පත්‍රිකාව සම්පූර්ණ කල පසු, එය නවා, තබා ඇති චන්ද පෙට්ටිය තුල බහාලන්න.
6. ඔබ AEC පැන්සලක් භාවිතා කලේ නම්, පිටවන ස්ථානයෙහි තබා ඇති පෙට්ටියට දමන්න.පිටවීම අසල විෂබීජ හරණයන් පාවිච්චිය සඳහා තබා ඇත.

**මතක තබාගන්න, සහය අවශ්‍යනම්, ඔබට විශ්වාසවන්ත අයෙකු කැටුව ආ හැකිය, නැතිනම් මැතිවරණ නිලධාරියකුගෙන් විමසිය හැකිය.**

**චන්දදායකයන් සහ කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව පිළිබඳ AEC දැඩි ලෙස සැලකිලිමත් වේ. AEC තවදුරටත් COVID-19 පරිසරය පිළිබඳව සුපරීක්ෂාවෙන් සිටින අතර අදාල සෞඛ්‍ය අධිකාරීන්හි උපදෙස් පිලිපදී.**
**මේ මගපෙන්වීම තුල ඇති තොරතුරු මුද්‍රණ අවස්තාවේ තත්වයන් පෙන්නුම් කරයි. එදිනද මෙලෙසින් පවත්වාගෙන යනු ඇති අතර යම් යම් වෙනස්වීම්ද ඇතිවිය හැක.**


**දෑත් විෂබීජහරණ පාවිච්චිය පිණිස තබා ඇති අතර මුඛ ආවරණයක් රැගෙන ඒමට, එය පැළඳීමට සහ ශාරීරික දුරස්ථභාවය සඳහා දිරිමත් කරනු ලැබේ. ඔබට පිරිසිදු AEC පැන්සලයක් භාවිතා කිරීමට හෝ ඔබේම පැන්සල හෝ පෑන රැගෙන ඒමට හැකිය.**

# ඔබේ චන්දය වලංගු චන්දයක් බවට පත්කරන අයුරු

මේ ජනමත විචාරණයේදී ඔබට ඔටේලියානු ව්‍යවස්ථාව කෙරෙහි යෝජිත සංශෝධනය සහිත චන්ද පත්‍රිකාවක් ලැබෙනු ඇත.

ඡන්ද පත්‍රිකාව මත:


ඔබ යෝජිත සංශෝධනය අනුමත කරන්නේ නම් **YES** යනුවෙන් සඳහන් කරන්න




චන්ද පත්‍රිකා නියැදිය

**නැතහොත්**

ඔබ යෝජිත සංශෝධනය අනුමත නොකරන්නේ නම් **NO** යනුවෙන් සඳහන් කරන්න




චන්ද පත්‍රිකා නියැදිය

ඔබේ ප්‍රතිචාරය ඉංග්‍රීසියෙන් සඳහන් කළ යුතුය.

ඔබ අතින් වරදක් වුවහොත් කලබල නොවන්න.
ඔබට නව චන්ද පත්‍රිකාවක් ලබාගෙන නැවත පටන්ගත හැක.

**අවුරුදු 18ක් හෝ ඊට වඩා වයසැති ඔස්ට්‍රේලියානු පුරවැසියන්හට චන්දය ප්‍රකාශකිරීම අනිවාර්යය වේ. ඔබ චන්දය ප්‍රකාශ නොකලහොත් දඩයකට හෝ නඩු පැවරීමකට ලක්වනු ඇත. එක වරකට වඩා ඔබ චන්දය ප්‍රකාශ කලහොත් එය සාපරාධී වරදෙකි.**